


## සුභාෂිතයෙන්...



මදයෙන් මත් මතඟ කුඹු තල පිරිමදිතී
විසයෙන් දැඩි උරග උර තෙලෙහි පලඳිතී
මෙලෙසින් අසරිමත් විසිතුරු සත කෙරෙතී
එමඳින් රජුනටත් සේවය කර රැකෙතී

**ගැදි කවිය:**
සත
මදයෙන් මත්
මතඟ කුඹු තල පිරිමදිති
විසයෙන් දැඩි උරග
උර තෙලෙහි පලඳිති
මෙලෙසින්
අසරිමත් විසිතුරු කරති
එ මඳින්
රජුනටත් සේවය කර
රැකෙති.



වි ක ධර්මබන්ධු

**තේරුම :**
හපන්නු -
සූරයෝ තම
හපන්කම් පෙන්වීමට මද කිපුනු ඇතුන්ගේ හිස අත ගාති; විස ගොර් සර්පයින් ගෙල වට දමා ගනිති. ඔවින් මේ කරන්නේ දකින්නන් විමතියට පත් කරනු පිනිසයි. එයින් නොනැවතී ඔහු රජුනටත් සේවය කරති. මේ තුනම කොතරම් අනතුරු සහිත වුවත් ඔහු තම ජීවිතය රැක ගනිති. මුලින් කී දෙක කොතරම් බියකරු ද, අනතුරු සහිත ද යන්න ඔබ දනිති. ඔහු ඒවා කොට අනතුරක් නොලබා ආරක්ශා වෙති. එපමනක් නොවේ. ඔහු රජුනටත් සේවය කරති. කොතරම් අනතුරු සහිත වුවත් ඔහු එය්නුත් අරක්ශා වෙති. මෙය, සමහරු..... මතඟ කුඹුතග පිරිමදිති. තවත් සමහරු..... උරග උර තෙලෙහි පලඳිති. තවත් සමහරු..... රජුනටත් සේවය කරති. මේ කවුරුත් ජීවිතවට අනතුරක් කර නොගෙන රැකෙති. යනුවෙන් ගලපා ගත් විට තේරුම් ගැනීම පහසු වේ.

පැහැදීම: මදයෙන් මත් = මද කිපුනු (ඇතින්නක හා එක්වීම සඳහා ඇති වන ගාය ් විසෝ), කුඹුතල = හිස, මෙය යෙදෙන්නේ ඇතුන්ගේ හිස සඳහා පමණි, උරග = නං පොලොං ආදී සර්පයින්.

රාජ සේවය කොතරම් අවදානම් - අන්තරාදායක වැඩක් ද යන්න පැවසීම කතුවරයාගේ අරමුන වන්නට ඇත. ඇතුන් සමගත් උරගයින් සමගත් කරන කෙලි සෙල්ලම් - දක්වන හපන්කම් අද වුවත් සර්කස් වලදී ඔබට දැක ගත හැකි ය.

බුදුන්ගේ ගමන මත් ඇතකු ගේ ගමන වැනි යය් කීම කොතරම් දුරට ගැලපේ දැය් මම නොදනිමි. "මත්ත ගජින්ද විලාසිත ගාමී - ඒ සහිතුය්හ පිතා නර සීහෝ - මත් ගිජිඳුන්නෙ විලස් ගමනින් පෑ හේ ඔබෙ වේ යැ පියා නර සී වූ" යනුවෙන් ඒ බව සඳහන් වේ.

පුවපත් දැන්වීම

Australian Government

පවුලේ අයගහට අනතුරු අඟවන්න
ඔවුන් නිවැරදි ක්‍රමයට එන්නේ නම්, පවුලේ අය සමඟ එක්වන සංක්‍රමණ වැඩසටහන යටතේ පැමිණීම වඩාත්ම හොඳම ක්‍රමයයි.



සදාකාලයටම කණගාටුවීමේ අවදානම ගන්න එපා.
නීතිය වෙනස්වී ඇත. සත්‍ය කරුණු දැනගන්න
www.australia.gov.au/dontbesorry
කණගාටුවෙන්න එපා

අනුමත කලේ, කැන්බරා, කැපිටල් හිල් හි ඕස්ට්‍රේලියානු රජය මගිනි.
Authorised by the Australian Government, Capital Hill, Canberra.